

ඩබ්.ශෂිකලා නුවන්ගි මධුමාලි
ඉබ්බාගමුව මධ්‍ය මහා විද්‍යාලය

# ගැමි සිතක සුවාද



පොළව ගිනියං වෙලා. ආකාසෙ රතු ම රතු පාටයි. හැන්දෑ උණත් තාම මද්දහන වාගෙ රස්නෙ. අප්පොච්චි ඉහිං කනිං දාඩිය බේරි බේරි තාමත් වලවල් හාරනව. අලවංගුවෙං බිමට අනිද්දි උන්දැගෙ ඉල ඇට කූඩුවම උස් පාත් වෙනව මට හොඳට පේනව. පස් කණ්ඩිය උඩට වෙලා ඇණ තියාගෙන උන්නු මං කම්මැලිකම යන්ටත් එක්ක උදැල්ල ගෙනැත් බිම උදලුගෑව.

''කොලුවෝ....ඔය මයියොක්ක දඬු ටික ඇන්න වරෙං''

අප්පොච්චි වලවල් හාරන අතරෙ මං උන්දැ හාරල අහවර කරපු වලවල් වල පේළියෙං පේළියට මයියොක්ක දඬු හිටෙව්ව. හය මාසෙකිංවත් වැස්සක් වැටුණෙ නැති හංද පොළව හයි වෙලා. අලවංගුව ඉහළ පහළ යනවත් එක්කම අප්පොච්චි හති අරින සද්දෙ ඇහෙනව.

''දැං මාත් ටිකක් හාරන්ටද අප්පොච්චි ?''

මං කර කර උන්නු කාරිය නවත්තල අප්පොච්චිට කිට්ටු වෙලා ඇහැව්ව.

''හහ්! හොඳට හිටී....හෙට පාංදර වෙනකං වලවල් හාරන්ටද ?
බොට ඇහැක් දෙයක් කරපං''

අප්පොච්චි කියාපු දේ අහල මට ලැජ්ජත් හිතුණ.අප්පොච්චි බිම හාරන වේගෙට මට නං හැරෙන්ටවත් බෑ...දැං දැං ඇඟට වාරු නැති උණාට මහ පොළවෙ පැළවෙලා , උඩට මතුවෙන්නෙ උන්දැගෙ හිතේ දහිරිය තමා.

මං හීං සීරුවෙ පනිට්ටුවෙං වතුර ටිකක් ගෙනැත් අප්පොච්චි වලවල් හාරන තැං වලට දැම්ම.එහෙම කළාම පස් බුරුල් වෙලා හාරන්ට ලේසි වෙනව.

වලවල් ටික හාරලත් අහවරයි. අප්පොච්චිත් මයියොක්ක දඬු හිටවන්ට පටං ගත්ත.

''කොලුවො ටිකක් අත ඉක්මං කරපං! ''

අප්පොච්චි දඬු හිටවන්ට පටං ගත්තෙ පොළවට වැඳල. නියං කාලෙක උණත් අප්පොච්චිගෙ අතිං හිටෝන ගහක් කොළක් බෑයි නොකිය පල දරනව.හරියට විජ්ජාවක් වගේ.අපරාදෙ කියන්ට බෑ උන්දැ හිටෝපු කෙහෙල් පඳුරක උණත් වහංගත ලෙඩක් නැතුව හොඳ කෙහෙකං පලගන්නව. මයියොක්ක, බතල විතරක් නෙවේ...පුහුල්, තියඹරා, නියං වැටකොළු හෙම අවාරෙත් පලදාව.ඒ ඔක්කෝම ඉතිං අප්පොච්චිගෙ අත් ගුණේ හංද තමා...

පාත්බඩ හේං කෑල්ලෙ ඉන්දපු මයියොක්ක ගස් ටික නං දැං හොඳට උස් මහත් වෙලා.පහුගිය කාලෙම අප්පොච්චියි මායි දොළෙං වතුර ඇද ඇද ඒවට සාත්තු කළා.

අප්පොච්චි කුඹුරු වගා කළේ නැති හංද වී මිලේට ගත්තෙ සයිමන් උන්නැහේගෙං. හුඟක් වෙලාවට වී බුසලක මිල ගෙවන්නෙ අපේ හේනෙ වැවෙන මයියොක්ක ,බතල වලිං තමා. මේ මාසෙ වැස්ස නැති හංද පළාතෙම කුඹුරුවල අස්වැන්න හිඟයි.කිසිම ගෙදරක දෙවේලක් බත් ඉදෙන්නෙ නෑ.සමහර ඈයො සුමානෙකට වතාවයි බත් තම්බන්නෙ.මුළු පත්තෑයමේම ඈයොංගෙ බඩසාය නිවුණෙ අප්පොච්චිගෙ හේං මයියොක්ක වලිං තමා.

හේං රාජකාරි ටික අහවර වෙලා අපි ආපහු යංට හැරුණෙ අම්බදොම්බමේ. ඉණිමංකඩ ළඟ ඇළ කඩිත්තෙන් ඇඟපත හෝදගත්තු අප්පොච්චි ඉට්ටු කට්ටු ටිකත් හොඳට හෝදල පිරිසිදු කෙරුව. පණ නැති දේකට උණත් කෙළෙහි ගුණ සලකන එක අප්පොච්චිගෙ පුරුද්ද.

''තනි එකා මතුවෙන්ට කලිං යම !''

මං ගාටනකොට අප්පොච්චි සැර උණා. යාංතමට හඳ එළිය පාරට වැටිච්චි හංද සතා සරපය මගෑරල යංට පුළුහං.

''විරූපක්ඛේහි මේ මෙත්තං - මෙත්තං ඒරාපථේහි මේ....''

අප්පොච්චි මටත් ඇහෙංට බන්ධ පිරිත කියනව. ඒ පිරිත සද්දාවෙං කියනකොට කිසිම සතෙක්ගෙං සරපයෙක්ගෙං වින්නැහියක් වෙන්නෙ නෑලු. එක දොහක් රෑ හේනෙ පැල් රැකල , හීනියට ඉර එළිය වැටීගෙන එද්දිං අප්පොච්චි ගෙදර එංට පිටත් වෙලා තියනව. ඒ වෙලාවෙ ඇළකඩිත්ත ළඟදි තනි එකා උන්දැගෙ මූණටම මුලිච්චි වෙලා.....! පර්වතයක් තරං විසාල උඹ අප්පොච්චි දිහෑ බලාන උන්නෙ හරියට රාස්සයෙක් වගේලු. ඒ වෙලාවෙ අප්පොච්චිගෙ හිත ටිකක් ගැස්සිල තියනව. ඒත් උන්දැට එකපාරටම මතක් වෙලා තියෙන්නෙ මහා බලගතු " අංගුලිමාල පිරිත ". උන්දැ එහෙම්ම බිමට නැවිල කන්දෙ විහාරෙ තියෙන ඉසව්ව දිහෑ බලාගෙන ..දෝත් මුදුන් තියාගෙන...සද්දාවෙං අංගුලිමාල පිරිත කියංට පටං ගත්තලු. තනි එකා ටික වෙලාවක් බලං ඉඳල එහෙම්ම ආපහු කැලෑව දිහෑවට ගෑටුවලු.

* * * * * * * * *

අපි ටිකෙං ටික ගෙදරට සේන්දු වෙනකොටත් අම්ම පිල්කඩට වෙලා මඟ බලං ඉන්නව. අප්පොච්චිව දැක්ක ගමං ඉස්සරහට ආපු අම්ම උන්දැගෙ අතේ තිබ්බ පං මල්ලයි, සාලුවයි අතට ගත්ත. අප්පොච්චි ඉට්ටු කට්ටු ටික පිළිකන්නෙං තියල ගෙට ගොඩ උණා. අම්ම විජහට කුස්සිය දිහෑවට ගියේ අප්පොච්චිට බෙලිමල් වතුර ඇන්න එංට.
'' අම්මේ....මටත් බෙලිමල් වතුර ටිකක් ඇන්න එංටෝ....''

එහෙම කියල මං ළන්දෙං කඩාගත්තු එරමිණිය ගෙඩි ටික ගණං කරංට පටං ගත්ත.

"ඇයි උඹට කකුල් දෙකක් නැද්ද ? "

ඒ සද්දෙට මං එකපාරටම ගැස්සිල ගියා. අප්පොච්චි මං දිහෑ රවාගෙන බලං ඉන්නව.

"දෙමව්පියංගෙං වැඩ ගංට හොඳ නෑ බොල ! ආත්මයක් ආත්මයක් ගාණෙ උඹට අඩු කුලේ ඉපදිලා දාසකං කරංට වෙයි. ඕවගෙ කරුම විපාක ලේසි පාසු නෑ....''

මං බිම බලාගෙන අප්පොච්චිගෙ අවවාදෙ අහගෙන උන්න. මගෙ ඇස් දෙකෙං කඳුළු පයිංටත් ළඟයි. අප්පොච්චි ටිකක් සැරෙං කතා කෙරුවොත් ඉබේටම මගෙ ඇස් වලිං කඳුළු බේරෙනව. ඒ බයටම නෙවෙයි , අප්පොච්චිට තියන ගවුරවේට ....

ටික වෙලාවකිං අප්පොච්චි මගෙ ඔළුව අතගෑව.

"කුස්සියට ගිහිං බෙලිමල් වතුර ටිකක් බීපං...''

ඒ වචන වල අප්පොච්චිගෙ ආදරේ පිරිල තිබුණ. ආයෙනං කවදාවත් ඒ වැරැද්ද කරන්නෙ නෑ කියල මං හිතාගත්ත.

දවසිං දවස පෑවිල්ල එංට එංටම තද උණා.ගමේ තිබ්බ මහ වැවත් හිඳෙංට පටං ගත්ත. හේං, කුඹුරු වේලිලා ගිහිං....අන්තිමේදී මුළු ගමටම ඉතුරු උණේ අපෙ අප්පොච්චිගෙ මයියොක්ක හේන විතරයි.

"අප්පොච්චි හැම වගාවක්ම පටං ගත්තෙ බුදුගුණ සිහි කරලනෙ මයෙ පුතේ....ඒකයි අප්පොච්චිගෙ වගාව කවදාවත් පාළු වෙන්නෙ නැත්තෙ.''
අම්ම නිතරෝම කියන්නෙ එහෙම.

අපි හැම පාළොස්වක පෝය දවසක ම කන්දෙ විහාරෙට ගිහිං උපෝසථ සීලෙ සමාදං වෙනව. සමහර උදවිය හැංදෑවට සිල් මුදල ගෙවල් වලට යනව. ඒත් අපෙ අම්මයි අප්පොච්චියි පහුවදා එළි වෙනකල් ම උපෝසථ සීලෙ ආරස්සා කරනව. හඳ එළිය වැටුණු බෝ මළුව ළඟට වෙලා අප්පොච්චි අපිට ජාතක කතා කියල දෙනව. අපි තුං දෙනාම හඬ නගල ලස්සනට බුදුගුණ කවි කියනව.එදාට අපේ හිත් වලට පුදුමාකාර සැනසිල්ලක් දැනෙනව.

මාස් පෝය හත අටක් ම ගෙවිල ගියා. ඒත් එක වැහි පොදක්වත් පොළවට වැටුණෙ නෑ. සමහර මිනිස්සු කිව්වෙ මේක දේව කෝපයක් කියල. ඒ අතරෙ සමහර උදවිය තොවිලයක් නටංට සූජානං වෙනව.

" ඔය තොවිල් පවිල් කරංට ඕනැන්නෙ නෑ ...ගමේම උදවිය එක්කාසු වෙලා මහ සංඝරත්නෙට දානයක් දීල පිරිතක් කියමු.....''

අපෙ අම්ම නං ගෙදරට එන හැමෝටම දුන්නෙ ඒ උපදේසෙ.

මේ කාලෙ අප්පොච්චි වෙනදටත් වඩා මාංසියෙං මයියොක්ක වලට සාත්තු කරනව. හැම දොහකම මයියොක්ක ගෙනියංට අපේ ගෙදරට දහ පාළොස් දෙනෙක් එනව. අප්පොච්චි ඒ හැමෝටම එක සමානව මයියොක්ක බෙදල දෙනව.ඒ විදිහටයි අප්පොච්චි මුළු ගමේම ඈයොංගෙ බඩගින්දර නිව්වෙ. හාමත් වෙලා උන්නු එක මනුස්සයෙකුට හරි කංට දෙන එක මහ විසාල පිනක්ලු....එහෙමයි අප්පොච්චි කියන්නෙ.

තවත් සුමානයක් දෙකක් ඒ විදිහටම ගෙවිල ගියා. එක දොහක් උදෑහැනැක්කෙම කංදෙ විහාරෙ ආවතේව කරන හීං ආතා කලබලෙං වගේ අපේ ගෙවල් පැත්තට ඇවිදගෙන ආව . උන්දැ ඇවිදිල්ල තියෙන්නෙ මයියොක්ක ටිකක් ඉල්ලං යංට. මේ සාගතේ හංද ගමේ උදවිය විහාරෙට ගේන දානෙ වේලත් මඟාරිංට පටං ඇරංලු. ඒත් ස්වාමින් වහන්සේල කුසගින්දරේම භාවනා කරනවලු. මේක බලා ඉන්ට බැරිම තැන තමා හීං ආතා අපෙ ගෙදරට ඇවිදිල්ල තියෙන්නෙ.

ඒ ආරංචිය අහපු ගමං අප්පොච්චිගෙ ඇස් දෙකේ කඳුළු පිරුණ. කවදාවත් ම අඬල නැති අප්පොච්චි ඒ වෙලාවෙ අඬංට පටං ගත්ත.

''අනේ ඇයි හීං ආතේ මේ වගක් අපිට කලිං දැනුං දුන්නෙ නැත්තේ...අපි හිතාගෙන උන්නෙ වෙනද වගේම ගමේ ඈයො පංසලට දානෙ දෙංට ඇති කියලා.....''

එහෙම කියපු අම්මත් කුස්සියට දුවගෙන ගියේ කලබලෙං වගේ. අප්පොච්චි ගෙදර තිබ්බ්ච සේරෝම මයියොක්ක ටික ගෝනියකට දාංට පටං ගත්ත.

" අනේ...අපෙ මහා සංඝරත්නෙ කුසගින්දරේ ඉන්දැද්දි අපි කෝමද කාල බීල උන්නේ... අපෙ අතිං සිද්ද උණේ විසාල වැරැද්දක් හීං ආතේ...''

46 වන පිටට